# FORMS OF GOVERNMENT (Part III)

ClassWork.LK

# අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමය

අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමයක ඒකීය ආණ්ඩුක්‍රමයක් සතු ලක්ෂණ සහ සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ යන දෙක ම එක විට හඳුනාගත හැකි ය. මේ අනුව ඒකීය සහ සන්ධීය ආණ්ඩුක්‍රම යන වර්ග දෙකට අතරමැදි ව පවතින ආණ්ඩුක්‍රමයක් ලෙස අර්ධ සන්ධීය ක්‍රමය සැලකිය හැකි ය.

ඉන්දියාව අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් සම්බන්ධයෙන් දිය හැකි හොඳ ම උදාහරණයයි. ඉන්දියානු ආණ්ඩුක්‍රමය සලකනු ලබන්නේ සන්ධීය ආණ්ඩුක්‍රමයක් හෝ ඒකීය ආණ්ඩුක්‍රමයක් හෝ වශයෙන් නොව අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස ය.

ද්විත්ව ආණ්ඩු ආයතන ක්‍රමය සහ ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය යන ලක්ෂණ මගින් ඉන්දියානු ව්‍යවස්ථාව මූලික වශයෙන්ම සන්ධීය ආණ්ඩුක්‍රමයක ගති ලක්ෂණ පෙන්නුම් කළ ද, ඒ සමඟ ම ඒකීය රාජ්‍යයක පවතින බොහෝ ගති ලක්ෂණ ද අන්තර්ගත කරගෙන ඇත.

උදාහරණ වශයෙන් ඒකීය පුරවැසි භාවය, නිලබල ක්‍රමයේ ආධිපත්‍ය සහ මේ සියල්ලට ම ඉහළින් මධ්‍යම ආණ්ඩුවට විශාල බලතල ප්‍රමාණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අත්කර දීම දැක්විය හැකි ය.

ClassWork.LK

ඉන්දියානු ව්‍යවස්ථාව තුළ ඇති බලතල බෙදීම විමර්ශනය කරන විට පැහැදිලි වන්නේ එරට ව්‍යවස්ථාව මධ්‍යම ආණ්ඩුවට පක්ෂපාත අයුරින් ක්‍රියා කර ඇති බව යි. මේ සම්බන්ධයෙන් උදාහරණ කිහිපයක් දැක්විය හැකි ය.

උදාහරණ වශයෙන් හදිසි අවස්ථාවක් ප්‍රකාශ ඇති අවස්ථාවක ප්‍රාන්ත ආණ්ඩුවල විෂය ලැයිස්තුව සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවට නීති සම්පාදනය කළ හැකි ය. එමෙන් ම මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත ආණ්ඩුවල විධායක බලතල පාලනය කළ හැකි ය.

සැබැවින් ම හදිසි අවස්ථා කාලයක දී ඉන්දියානු ව්‍යවස්ථාව ඒකීය රාජ්‍යයක ගති ලක්ෂණ පෙන්නුම් කරයි. ඉන්දියානු ව්‍යවස්ථාවෙහි හදිසි අවස්ථා වර්ග තුනක් සඳහන් වේ. එනම්

Class Work LK

1)ජාතික හදිසි අවස්ථාව

ඉන්දියාව බාහිර ආක්‍රමණයකට හෝ අභ්‍යන්තර කැලැඹීමකට හෝ මුහුණ දුන් විටක ව්‍යවස්ථාවේ 352 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථාවක් ප්‍රකාශ කළ හැකි ය.

2)ප්‍රාන්ත හදිසි අවස්ථාව

කිසියම් ප්‍රාන්තයක ව්‍යවස්ථා යාන්ත්‍රණය බිඳ වැටුණු අවස්ථාවක ව්‍යවස්ථාවේ 356 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි ය.

3)මූල්‍ය හදිසි අවස්ථාව

ඉන්දියාවේ මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනයක් ඇති වූ විටක ව්‍යවස්ථාවේ 360 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි ය.

ClassWork.LK

ඒ හැරුණු විට සාමාන්‍ය කාලවල දී පවා මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවට ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයන්ගේ අනුමතියකින් තොර ව සරල බහුතරයකින් නව ප්‍රාන්ත පිළිගැනීම හෝ ප්‍රාන්තවල දේශ සීමාවන් වෙනස් කිරීම හෝ කළ හැකි ය.

ඇමෙරිකානු ව්‍යවස්ථාව සම්භාව්‍ය පෙඩරල් ආකෘතියක් ලෙසින් විස්තර කරන කේ. සී. වියර් ඉන්දියානු ව්‍යවස්ථාව විස්තර කරන්නේ අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස ය.

අතිරේක ඒකීය ලක්ෂණ සහිත පෙඩරල් ආණ්ඩුක්‍රමයකට වඩා අතිරේක පෙඩරල් ලක්ෂණ සහිත ඒකීය ආණ්ඩුක්‍රමයක් ලෙස ඔහු ඉන්දියානු ආණ්ඩුක්‍රමය හඳුන්වයි.

මෙය ඔහු කැටි කොට දක්වන්නේ ඉන්දියානු ආණ්ඩුක්‍රමය ස්වරූපයෙන් පෙඩරල් වුව ද සාරයෙන් ඒකීය ආණ්ඩුක්‍රමයක් වන බව ප්‍රකාශ කරමිනි. එහෙත්, ප්‍රායෝගික වශනේ ඉන්දියානු ආණ්ඩුක්‍රමයෙ පෙඩරල් ලක්ෂණ ශක්තිමත් වී ඇති බව ද කිව හැකි ය.

Class Work.LK

ClassWork.LK